"එයා මොකටද දිනූෂලගේ ගෙදර ඉඳන් නිශ්කව හම්බවෙන්න දුවගෙන ආවේ....."

"ඒක හොඳ ප්‍රශ්ණයක් තමයි...."

මහීකා වළලු එකිනෙක තම සුරතෙහි දමා ගත්තාය.
"යොමු කරන්න ඕනි, අපේ කිසිම ඉවසිල්ලක් නැති අජයට"

"සුමති, නිශ්කගේ නෑයෙක් වෙන කතාවක් එයාලා උදේ කියනවා මම අහගන.....

ඔහේ මොනවද කතා උණෝ කියන එක නිශ්කගේ කණේ තියන්න එන්න ඇති." අමා කීවාය.
"ඒ විතරක් නෙමේ. රිද්මා ආපුබවත් දන්වන්න ඇති !" රිදීමාගේ ගත කිළිපොළා ගියේය.

"දැන් ඇති ඔය වළලු එක්ක දැඟලුවා. ඒ ටික ආපසු තිබුණු තැනක දාන්න." අමා, මහීකාගේ සුරතට තට්ටු කළාය.

"දැන් ඔයා හොයන දේවල් හොයලා ඉවරද ? මොනවා හරි අළුතෙන් හොයා ගත්තද ?"

අමා හැරුණේ, රිදීමා වෙතය. රිදීමා හිස වැනුවාය.

"කිසිම දෙයක් නෑ. ඒත් අපි ටිකක් බලමුද ?"
යෙහෙළියෝ නැගිට ගත්තෝය.

"තව කොහෙද අපට බලන්න තියෙන්නේ ?"

"ඇඳ යට බැලුවේ නෑ....."

රිදීමා නැමී, ඇඳ යටට එබුණාය.

"කිච්චත් වගේ පෙට්ටියක් තියෙන්නේ !"
මහීකාද නැඹුරුව බැලුවාය.
"අපේ ආත්තලාගේ කාලේ පෙට්ටියක්"

*රිදීමාගේ දෙසවන් යම් හඬකින් දෝංකාර වන්නාක් මෙන් ඇයට දැනී ගියේය. දෑත් සලමින් නටන පියකරු යුවතිය නිතරම මේ ගෙජ්ජි කුට්ටම පැළඳ සිටිනු රිදීමාට මතකය. ඔහුගේ ශක්තිමත් දෑතින් බෙරය වැයෙද්දී, ඇය තාලයට නැටුවේ, මේ ගිගිරි බැඳි පාද සොපවමිනි.*

පෙට්ටිය බර එකක් වූ බැවින් ඔවුනට එය එළියට ගැනීම සඳහා දැඩි වෙහෙසක් දැරීමට සිදුවිය. අජය හෝ දිනූෂට කතා කිරීමට තැනුවද, රිදීමා එයට අකමැති වූවාය.

"ඇතුලෙ තියෙන්නේ මොනවද කියලා දන්නේ නැතිව එයාලා මෙතෙනට ගෙන්නන්න ඕන නැහැ...."

පෙට්ටියට ඉබ්බෙක් දමා තිබිණි.

රිදීමා ඉබ්බා ඇද්දාය.

"යතුරු කෝ ?"

"ඕකට යතුරක් ඕන නෑ. පොඩ්ඩක් ඉන්න....."

මහීකා කුඩා පෑන පිහියක් තම අත්බෑගයෙන් එළියට ගත්තාය. ඉබ්බා කැඩීමට ඇයට ගතවූයේ සුළු මොහොතකි.

"මේක හොඳයි හොරකමේ අරින්න" අමා මහීකාට පහරක් එල්ල කළාය.

"විභාගේ ෆේල් උණොත් ඒක තමා කරන්න හිතාගෙන ඉන්නේ !"

යෙහෙළියෝ පෙට්ටිය වටා හිඳගත්තාහ.

"ඔය හැටි හිතන්න දෙයක් නෑ. අරිනවා...."
මහීකා පැවසුවාය.

රිදීමා මොහොතකට දෑස් පියා ගත්තාය. අනතුරුව සෙමෙන් දෑස් විවර කොට පෙට්ටියෙහි පියන ඇරියාය. එතුලින් ආවේ සැවැන්දරා මුල් සුවඳක් හා මිශ්‍ර වුණු කපුරු සුවඳකි. කුමක් දෝ කිව නොහැකි හැඟීමකින් ළය පිරී යනු රිදීමාට දැනුණේය. ඈ උඩින්ම වූ තුනී සාළුව මෑත් කළාය.

"මේ මොකක්ද ?" ඇගේ උරිස්සට උඩින් එබී උන් මහීකා ඇසුවේ විමතියෙනි.

"ගෙජ්ජි වැලක්....." අමා පැවසුවාය.

රිදීමාගේ දෙසවන් යම් හඬකින් දෝංකාර වන්නාක් මෙන් ඇයට දැනී ගියේය. දෑත් සලමින් නටන පියකරු යුවතිය නිතරම මේ ගෙජ්ජි කුට්ටම පැළඳ සිටිනු රිදීමාට මතකය. ඔහුගේ ශක්තිමත් දෑතින් බෙරය වැයෙද්දී, ඇය තාලයට නැටුවේ, මේ ගිගිරි බැඳි පාද සොපවමිනි.

"මේ බලන්න....."

මහීකා සුදු යුනිෆෝමයක් පෙන්වූවාය. අමා එය සෙමින් පසෙකට කළාය. පෙට්ටිය තුළ වූයේ යුවතියක, පාසල් සමයෙහි පාවිච්චි කරනා ලද රෙදි පිළි හා පොත්පත්‍ය.

"මේකෙන් අපට කිසි දෙයක් තේරුම්ගන්න බෑ..... මේවා ඔයාගේ වෙන්න පුලුවන්. ආයම පාවිච්චි නොකරන හන්දා අම්මා මේවා අයින් කළා වෙන්න පුලුවන් !"

රිදීමා කතා නොකොට, රෙදි ඉවත් කළාය. තදට ගෙතුණු රැළි කෙස්, ලස්සණට රැළි තබා මදින ලද සුදු ගවොම, වරලෙහි බැඳුණු පීත්ත පටි, සුදු මේස්, ලේස් ගැට ගැසූ සුදු සපත්තු........

ඇය එතුල වූ බඩු එකින් එක අයින් කළාය. එහි යටින්ම වූයේ ආභරණ දමනා කුඩා පෙට්ටියකි.

තමා දැවී යනු රිදීමාට දැනුණේය.

"මේ තියෙන්නේ ඒ වළලු දෙක...."
අමා හා මහීකා එකිනෙකාගේ මුහුණු බලා ගත්තෝය.

පෙට්ටිය විවර කළ රිදීමා හීන් රන් වළලු දෙක එළියට ගත්තාය.

"මම මේක හැමතැනම හෙව්වා....." ඈ සෙමින් ඔවුනට පැවසුවාය.

මතු සම්බන්ධයි

19 වන පිටෙන්

මෙය දුටු හෙදි පාලිකාව ඈත සිට කොල්වින් වෙත දුවවිත් ඔහුව රෝගියාගේ ඇඳ ළඟට එක්කරගෙන ගියා. කොල්වින් තම නිලබලය කවදාවත් කොතනටවත් අයුතු ලෙස යෙදූ මිනිසෙක් නොවේ. සිය පකෂයේ ඉදිරි ගමනට දර දිය ඇද්ද, දහදිය හෙළූ පාකෂිකයන්ගේ නඩුවලට නොමිලේ පෙනී නොසිටින බවට කොල්වින්ට සම සමාජ පාකෂිකයන්ගෙන් නිතරම චෝදනා එල්ල වූ බව වාර්තා වෙනවා.

කොල්වින් නීතිඥ වෘත්තියයි දේශපාලනයයි එකට පටලවා ගත් කෙනෙක් නෙමේ. ඔහු නීතිඥ වෘත්තියෙන් ඉපයූ මුදල් පකෂයේ දියුණුවට යෙදූ වාර අනන්තයි. කොල්වින් සිය පාකෂිකයන් එල්ල කළ චෝදනා බැහැර කළා. එහෙත් පාකෂිකයෝ සිය මතයේම එල්බ සිටියා. එක දිනක් සම සමාජයේ තවත් ප්‍රබලයෙක් කොල්වින් හමුවට විත් සහෝදරයා අපේ පාකෂිකයන්ගේ නඩුවලටත් ඔබ සල්ලි අයකරන බවට චෝදනා තියනවා. ඒක බරපතල තත්ත්වයක් යැයි කීය.
"නෑ සහෝදරයා ඒක මම ප්‍රතිකෙෂ්ප කරනවා."

"නෑ නෑ... නෙමේ ඔව් මේ ළඟදිත් අපේ පකෂයේ පාකෂිකයෙක් නඩුවකට පෙනී සිටින්න කියල මගෙන් ඉල්ලුවා" කියමින් කොල්වින් එම කතාන්තරය මෙසේ කීය.
මම ගෙදර ඉන්න කොට හැඩි දැඩි තරුණයෙක් මාව හොයාගෙන ආවා තමා කොහෙන්ද කොල්වින් ඇසුවා

"ඇයි සර් මම අසවල් ශාඛාවෙ ලේකම්. එදා පටන්ම මම පකෂයට මැරිල වැඩ කළා."

"ඉතිං දැන් තමුන්නැහෙ මාව හමුවෙන්න ආවෙ ඇයි?"

"සර් මාව පොලිසියෙන් අල්ලන්න යනවා. මාව බේරගන්න..." කියමින් මේ තරුණයා හඬන්නට පටන් ගත්තා.
"මොකෑ කළ වරද"

"මම අසූවලාව මැරුව කියල පොලිසිය සොයනවා. මාව බේරගන්න."
"යූෂ්මතා ඔහුව මැරුවද?"
"ඔව් "
"කොහොමද? කැලෑ පාරකින් යන කොට පිහියෙන් ඇන්නා"
"ඉතින් කවුද දැක්කෙ? "
"දැක්කෙ නෑ "
"තමූසෙ දැන් කෙළින්ම පොලිසියට යනවා. ගිහිං බාරවෙනවා. මැරුවෙ තමූසෙ කියනවා. පොලිසිය තමූසෙට මොනව කළත් වෙන අනන් මනං මොකුත් කියන්න එපා. දැන් යනව ගිහින් බාරවෙනව. "

තරුණයා අඬමින්ම පොලිසියට ගොස් බාරවිය. සිද්ධිය එතකින් ඉවරයි. මාස හතකට පමණ පස්සෙ තරුණයෙක් කිරි පැණි හට්ටියි, බුලත් අතකුයි අරන් මාව හම්බවෙන්න ආවා.

"කවුද තමුන්නෑහේ?" කොල්වින් ඇසීය.
"ඇයි සහෝදරය මාව අඳුනන්නෙ නැද්ද? දැන් මාස හත අටකට කලින් මිනී මැරුමක් ගැන මට පොලිසියට භාරවෙන්න කියල ඇරියෙ."
"හා හා මතකයි... ඉතින් මොකද වූණේ. ?"

"මම භාර වූණා. උසාවි ගියා මාස ගානක් ඇසින් දුටු සාකෂි නැති නිසා මාව නිදහස් වූණා. සර් කරපු උදව්වට මට කරන්න හැකි එකම දෙය බුලත් අතක් දීල වඳින එක විතරයි. "

තමා පාකෂිකයන්ගේ නඩුවලට නොමිලේ පෙනී නොසිටින බවට පකෂයේම උසස් අයෙක් නැගූ චෝදනාවට කොල්වින් නිදශර්නයක් සහිතව පෙන්වා දෙමින් ඔන්න ඔහොමයි මම අපේ පාකෂිකයන්ගේ නඩුවලට නොමිලේ පෙනී සිටියේ යැයි කොල්වින් කීය. බැලුවම ඒකත් හරිය.

හෙක්ටර් ප්‍රනාන්දු ලංකා සමසමාජ පකෂයේ පතාක යෝධයෙකි. ඔහු මීගමුව මැතිවරණ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ද විය. මේ අසූනට වරක් මැතිවරණ පෙත්සමක් වැටුණේය. හෙක්ටර් ප්‍රනාන්දු වෙනුවෙන් පෙනී සිටියේ අති දකෂ කොල්වින්ය. කවුරුත් සිතුවේ චන්ද පෙත්සමින් හෙක්ටර් දිනාවි යන්නයි. නමුත් කොල්වින් පෙනී සිටී හෙක්ටර් පරාද විය. තීන්දුව ප්‍රකාශයට පත් කර අවසන් වීමත් සමඟම කොල්වින් පාර්ලිමේන්තු රැ ස්වීමට ගියා. එදා ලොකු විවාදයක්. මේ වන විට තීන්දුව මොකක්ද කියල පාර්ලිමේන්තුවටත් ආරංචිය ගිහිල්ල. කොල්වින්ට කතාව තිබූණේ හවස්වෙලා. කොල්වින් බොහෝම ඇදල පැදල ගෞරවනීය ලෙස කතානායක අමතල සභාව අමතන ව්‍යක්තම කථිකයෙක්.

කතානායක තුමනි.. මෙය දසතින් අඳුර පැතිරීගෙන එන වෙලාවයි... මෙය ගණ අඳුර මැද හිරි පොද වැටීගෙන එන වෙලාවයි... සිරුරට හීතල දැනෙන වෙලාවයි.. කොල්වින් ඔය විධියට තාලයට කතාව ඇරඹීය. බිංගිරියේ ලො. බ. ජයසේන කොල්වින්ගේ කතාව දෙස කට අයාගෙන බලා සිටියා. මේ වන විට මීගමුවේ පරාජයත් ඔහුටත් ආරංචි වී තිබූණා. සිරුරට හීතල දැනෙන වෙලාවයි කොල්වින් කියනවාත් සමඟ නැගී සිටි ලො. බ. ජයසේන මීගමුවත් පැරදුන වෙලාවයි කීවා. ලො. බ. ජයසේනගේ කතාවට මුළු සභාවම සිනාසූනා. කොල්වින් මොන තරම් විචකෂණ කථිකයෙක් වූවත් ලො. බ. ගේ වචනයෙන් අන්ද මන්ද වූහ.

සිනාසෙන මන්ත්‍රීන් දෙස බැලූ කොල්වින් තමාත් හයියෙන් සිනාසී කමක් නෑ... කතානායකතුමනි, මන්ත්‍රී වරුන්ටත් හිනාවෙන්න ඔනනෙ? ඉතිං සිනාසූනාවෙ... අපි අපේ කතාව නවත්තපූ තැන සිට පටන්ගම්මූ කියමින් සිය කතාව කරගෙන ගියේය.

විමලසේන ඉහළගම

